# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01 Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94) -11 - 2449823
වෙබ් අඩවිය / வெப் சைட / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.:
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2021 – 07 - 10


**<u>ප්‍රවෘත්ති නිවේදනය</u>**

**<u>රජය රසායනික පොහොර ආනයනය කිරීමට යන බවට</u>**
**<u>පැතිර යන අසත්‍ය ප්‍රචාර සම්බන්ධයෙනි</u>**

නව මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රකාශයක් බව කියමින්, රසායනික පොහොර ආනයනය කිරීමට රජය සූදානම් බවට සමාජ මාධ්‍ය සහ ඇතැම් වෙබ් අඩවි ඔස්සේ පැතිර යන ප්‍රචාරයේ කිසිදු සත්‍යතාවක් නොමැත.

මෙම ප්‍රචාරය, රජයේ කාබනික පොහොර විප්ලවය ආපසු හැරවීමට දරන ප්‍රයත්නයකි. එයට කිසිසේත් ම ඉඩ නොතබන බව නව මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතා අවධාරණය කරයි.

වකුගඩු ආබාධ, පිළිකා ආදී මාරාන්තික රෝග රැසකට හේතු වන රසායනික පොහොර භාවිතය ඉවත් කිරීමට රජය ගෙන යන මානුෂීය ක්‍රියාමාර්ගයට අකුල් හෙළීම සඳහා ගෙන යන මෙම මඩ ප්‍රචාරය රසායනික පොහොර ආනයනය කිරීමෙන් වාසි ලැබූ පාර්ශ්වයන්ගේ කූට ව්‍යාපෘතියකි.

සෞභාග්‍ය දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය යටතේ සෞභාග්‍යමත් දේශයක් බිහි කිරීමට අදාළ පියවර ගනිමින් සිටින මේ අවස්ථාවේ එම අරමුණු විනාශ කිරීමට කිසිවකුට ඉඩ නොදෙන බව පෙන්වා දෙන මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතා රටේ සමස්ත ජනතාවට සෞභාග්‍ය උදාකරමින් ඔවුන් බලාපොරොත්තු ඉටු කිරීම සිය අපේක්ෂාව බව සඳහන් කරයි.

මෙවැනි මඩ ප්‍රචාරවලින් සිදු වන්නේ රටට සේවය කිරීමේ සිය අධිෂ්ඨානය තව දුරටත් ශක්තිමත් වන බව ද මුදල් අමාත්‍යතුමා අවධාරණය කරයි.

**මාධ්‍ය අංශය,**
**මුදල් අමාත්‍යාංශය**